1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/12/05/01 | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.11. 14 |

දකුණු පළාත් සභාවේ
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු/ සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ සියලුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත.

**<u>වාහන සඳහා පූර්ණ රක්ෂණාවරණය ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම ලිපිය සමඟ යොමු කරනු ලබන දකුණු පළාත් ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 02/2025 සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරමි.

02. ඒ අනුව ඔබ යටතේ පවතින සියලුම ආයතන දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර, මෙම චක්‍රලේඛය දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලීය නිල වෙබ් අඩවිය මගින් ද ලබා ගත හැක.

ශෂී තාරුකා පී. මානවඩු
සහකාර ප්‍රධාන ලේකම්(පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

ශෂී තාරුකා පී. මානවඩු
සහකාර ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට,
දකුණු පළාත.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office — 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax — 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail — chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site — www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ : 02/2025

මගේ අංක: CSS/03/12/05/01
දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය,
එස්.එච්. දහනායක මාවත,
ගාල්ල.
2025.11. 14

දකුණු පළාත් සභාවේ
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු/ සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ සියලුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත.

**<u>වාහන සඳහා පූර්ණ රක්ෂණාවරණය ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/EST/CMSO/කැ.තීරණ හා 2025.08.20 දිනැති ලිපිය අනුව දකුණු පළාත් සභාවේ අත්‍යාවශ්‍යම වාහන පූර්ණ රක්ෂණය කිරීම සම්බන්ධයෙන් තීරණයක් ලබා දීමට පත්කරන ලද කමිටුව විසින් නිර්දේශ සහිතව ලබා දෙන ලද කමිටු වාර්තාව සඳහා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025.08.20 දින අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව දකුණු පළාත් සභාව සතු වාහන සඳහා පහත සඳහන් කරුණු සලකා පූර්ණ රක්ෂණාවරණය ලබා ගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම මෙම චක්‍රලේඛය අනුව සිදු කල යුතු වේ.

02. **පහත කොන්දේසි වලට යටත්ව දකුණු පළාත් සභා ආයතන මගින් පාලනය කරනු ලබන සියලුම වාහන පූර්ණ රක්ෂණය කිරීම.**

i. එක් එක් පළාත් පාලන ආයතනය විසින් ඔවුන් සතු වාහන කෙසේ රක්ෂණය කළ යුතු ද යන්න ඒ ඒ සභාවන් විසින් ම තීරණය කළ යුතු ය.

ii. සියලු ආයතන ප්‍රධානීන් විසින් වාහනවලට සිදුවන අනතුරු පිළිබඳ තොරතුරු සටහන් කිරීම සඳහා වෙනම ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

iii. සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් තමාගේ ආයතනයේ හා තමා යටතේ පවතින සියලු දෙපාර්තමේන්තු, ආයතන, අධිකාරී වල සිදු වූ වාහන අනතුරු පිළිබඳ සාරාංශ වාර්තාවක් අමුණා ඇති ආකෘතියට අනුව සෑම මාස 06 කට වරක් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ(මුදල්) වෙත යොමු කළ යුතුය.

(ජනවාරි 01 සිට ජූනි 30 දක්වා වාර්තාව එම වර්ෂයේ ජූලි මස 31 දිනට පෙරත්, ජූලි 01 සිට දෙසැම්බර් 31 දක්වා වාර්තාව ඊළඟ වර්ෂයේ ජනවාරි 31 දිනට පෙරත් ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු ය) මෙම චක්‍රලේඛය නිකුත් කළ දින සිට මසක් තුල දී 2025 වර්ෂයේ මුල් මාස 06 සඳහා වාර්තාව ඉදිරිපත් කළ යුතුය.( ඇමුණුම - 01)

iv. මෝටර් රථ වාහන ආඥා පනත යටතේ නීතියෙන් නියම කර ඇති පරිදි සෑම වාහන අනතුරක්ම අදාළ පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ලෙස සටහන් කළ යුතු අතර ඒ පිළිබඳ තොරතුරු අනතුරු පිළිබඳ ලේඛනයේ සටහන් කළ යුතුය.

v. වාහන අනතුරු පිළිබඳ පරීක්ෂණ නොපමාව ආරම්භ කර මාස 03 ක් තුළ අවසන් කිරීමට පරීක්ෂණය පවත්වන නිලධාරීන්ට උපදෙස් ලබා දිය යුතු ය.

vi. අනතුරකින් පසු පවත්වන පරීක්ෂණයේ අරමුණ වන්නේ කිසියම් වරදක් සිදුවී තිබේද යන්න හා එසේ වරදක් සිදුවී තිබේ නම් ඒ සඳහා වරදකරුවන් හඳුනා ගැනීම, ඉදිරියට එවන් අනතුරු සිදුවීම වළක්වා ගැනීමට අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගැනීම, හානියක්/ පාඩුවක් තිබේ නම් එය ප්‍රතිපූර්ණය කර ගන්නා ආකාරය තීරණය කිරීම ආදිය වේ. මේ

අනුව වාහනයකට කිසියම් අනතුරක් වූ පසු සිදුවූ හානිය 100% ක් ම රක්ෂණාවරණයෙන් ප්‍රතිපූර්ණය වුවත් විධිමත් මූලික විමර්ශනයක් පැවැත්වීම හා එමගින් අනාවරණය වන කරුණු අනුව යම් වරදකට වගකිය යුතු නිලධාරීන්ට සුදුසු පරිදි විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානියාගේ අනිවාර්ය වගකීම වේ.

vii. විමර්ශන නිලධාරීන් විවෘත මනසකින් යුතුව පරීක්ෂණය පැවැත්විය යුතු අතර වාහනයකට සිදුවන හානියකට/ පාඩුවකට අදාළ අයකිරීම් සිදු කිරීමේදී එක් එක් සිද්ධියට අනුව විචක්ෂණශීලීව කරුණු අනාවරණය කරගෙන ඒ සඳහා වගකිව යුතු මාණ්ඩලික නිලධාරීන්, විෂය නිලධාරීන් ආදිය කවරෙක් දැයි එම වාහනය භාර රියදුරුට අමතරව සඳහන් කළ යුතුය. මෙමගින් අදහස් වන්නේ සෑම විටම වාහනයේ රියදුරු පමණක් තනිව වගකීමට බැඳී නොසිටින බවයි.

viii. අනතුරක් සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ විමර්ශනයකින් අනතුරුව ඒ සඳහා වගකිව යුතු රියදුරු හෝ නිලධාරියා/ නිලධාරීන්ගෙන් යම් අයකිරීමක් සිදු කිරීමේදී, ඊට අදාල රථය නැවත රක්ෂණය කිරීමේදී රක්ෂණ වාරික මුදලට වැඩි පුර එකතු වන මුදල (රජයට අහිමිවන ප්‍රසාද දීමනාව No Claim Bonus) ද ගණනය කර සුදුසු පරිදි අයකළ යුතු ය.

ix. සෑම ආයතන ප්‍රධානියෙකුම තමන්ගේ කාර්යාලයේ සේවය කරන නිලධාරීන් අතුරින් ප්‍රමාණවත් පිරිසකට වාහන අනතුරු පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමේ පුහුණුවක් ලබා දී තිබිය යුතු ය.

x. හැකි සෑම විටම වාහන පූර්ණ රක්ෂණය කිරීමේදී ඒවා වාහන කණ්ඩායමක් ලෙස (Fleet Insurance) රක්ෂණය කිරීමෙන් වියදම අවම කළ යුතු ය. මේ සඳහා අමාත්‍යාංශ මට්ටමෙන් හෝ දෙපාර්තමේන්තු මට්ටමෙන් සලකා බැලිය හැකි ය.

xi. සෑම වාහනයක් වෙනුවෙන්ම පවත්වාගෙන යන ධාවන සටහන් පොතේ, සටහන් කිරීමට දක්වා ඇති සෑම කරුණක්ම නිවැරදිව සටහන් කිරීම රියදුරු මහතුන්ගේ වගකීමකි. ඒ බව විෂය නිලධාරී හා විෂය භාර මාණ්ඩලික නිලධාරීන් විසින් අධීක්ෂණය කිරීම කාලානුරූපව සිදු කළ යුතුය.

03. වාහන පූර්ණ රක්ෂණය කිරීමේදී එමගින් ආවරණය වන අවදානම් ක්ෂේත්‍ර පිළිබඳව කිසියම් සමරූපී බවක් තිබිය යුතු අතර පළාත් අරමුදල් වියදම් කිරීමේ සීමා පැනවීම ද සුදුසු වේ. ඒ අනුව පූර්ණ රක්ෂණයේදී පහත සඳහන් ක්ෂේත්‍ර, එහි සඳහන් උපරිම වටිනාකමින් යුතුව ඇතුළත් විය යුතු ය.

i. අනතුරු, අභ්‍යන්තර හෝ බාහිර පිපිරීම්, සොරකම් හෝ එවැනි ක්‍රියාවක් නිසා වාහනයට සිදුවන හානියක් හෝ වාහනය අහිමි වීම.
ii. තෙවන පාර්ශ්වයක් මරණයට පත් වීම හෝ තුවාල සිදුවීම.
iii. තෙවන පාර්ශ්වයක දේපල හානිවීම රු 10,000,000.00 දක්වා.
iv. වාහනයේ කොටස් සොරකම් කිරීම.
v. රියදුරු හා මගීන්ගේ ජීවිතයට හානි වීම් හෝ තුවාල සිදු වීම් රක්ෂණය රුපියල් 500,000.00 ක් (එක් අයෙකුට).
vi. වර්ජන, කැරලි කෝලාහල නිසා සිදුවන හානි.
vii. ගංවතුර, නායයෑම් ආදී සියලු ස්වාභාවික අනතුරු.
viii. අනතුරකදී ඇදගෙන යාමේ ගාස්තු රු 15,000.00 දක්වා.

04. සියලු වාහන පූර්ණ රක්ෂණය කිරීමේදී උපරිම වශයෙන් වසර 03 කට වරක්වත් එම එක් එක් වාහනයේ වටිනාකම පිළිබඳව පිළිගත් ආයතනයකින් හෝ වෘත්තිකයෙකුගෙන් ලිඛිත තහවුරුවක් ලබා ගත යුතු ය.

05. ඉහත අංක 03 හි සඳහන් පූර්ණ රක්ෂණයේ සීමාවන් ඉක්මවා යන පරිදි කිසියම් වාහනයක් එහි අන්තර්ගත සුවිශේෂී උපාංගවල වටිනාකම සලකා බලා හෝ විශේෂ වශයෙන් රක්ෂණය කළ යුතු යයි ආයතන ප්‍රධානියා අදහස් කරන්නේ නම්, පහත සඳහන් නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක නිර්දේශ සලකා බලා අනුමැතිය ලබා ගැනීමට දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කිරීම කළ යුතුය. එම කමිටුවේ සංයුතිය පහත පරිදි විය යුතු ය.

01. ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා - කමිටු සභාපති
02. දෙපාර්තමේන්තු ප්‍රධානියා - සාමාජික
03. පළාත් භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු - සාමාජික

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

CSS/7/FO -7

ඇමුණුම - 01

# ප්‍රධාන ලේකම් කාර්යාලය
## දකුණු පළාත් සභාව සතු වාහනවල (නිල/සංචිත) හදිසි අනතුරු පිළිබඳ අර්ධ වාර්ෂික සංගණනය

........................ දින සිට ........................ දින දක්වා

ආයතනය ..................................................

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | වාහන වර්ගය | ලියාපදිංචි අංකය | රියදුරුගේ නම | වාහනයේ ස්වභාවය | | හදිසි අනතුර සිදු වූ දිනය | හානියේ ස්වභාවය | හානියේ තක්සේරු වටිනාකම රු. | අළුත්වැඩියාව සඳහා දරන ලද සත්‍ය වියදම රු. | හානි පූර්ණය කරගත් ආකාරය රු. | | | රජයට සිදුවූ පාඩුව රු. | වාහන අනතුර පිළිබඳ දැනට පවත්වන පරීක්ෂණයේ වර්තමාන තත්ත්වය |
| | | | | නිල | සංචිත | | | | | රජය මගින් දරණ ලද වියදම රු. | රක්ෂණය මගින් ප්‍රතිපූර්ණය කළ මුදල රු. | වගකිව යුත්තන්ගෙන් අයකර ගත් මුදල රු. | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

සකස් කළේ........................

පරීක්ෂා කළේ....................................

................................
ගණකාධිකාරී

ISSUE No: 01

REV No:

D.O.R

D.O.I. 2025.08.28